# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2019
## First Term Test - 2019

බුද්ධ ධර්මය - I, II
Buddhism - I, II

කාලය පැය 2 යි.

නම :- ............................................. විභාග අංකය :-

9 ශ්‍රේණිය

## I කොටස

- **1 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයේ සිට පිරිනිවීම තෙක් කෙතරම් කාලයක් පරාර්ථ සේවයේ නියැලුනේද?

(i) වසර විසිපහකි. (ii) වසර තිහකි.
(iii) වසර තිස්පහකි. (iv) වසර හතලිස් පහකි.

(02) බුදුරජාණන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයාණන් වහන්සේ ලෙස සැලකෙන භික්ෂූන් වහන්සේ,

(i) ධර්මාරාම භික්ෂුව (ii) සුභද්‍ර භික්ෂුව
(iii) චුල්ල පන්තක භික්ෂුව (iv) මහා පන්තක භික්ෂුව

(03) බුද්ධ මාතා යන ගෞරවණීය නාමයෙන් පිදුම් ලැබූ භික්ෂුණිය වන්නේ කවුද?

(i) මහා මායා දේවිය (ii) යශෝදරා දේවිය
(iii) ප්‍රජාපතී ගෝතමීය (iv) විශාකා මහෝපාසිකාව

(04) සතර අගතියට අයත් නොවන කරුණකි.

(i) විඥානය (ii) ඡන්දය (iii) ද්වේෂය (iv) මෝහය

(05) බුදුරජාණන් වහන්සේගේ ශරීරය පුරා පිහිටි පුරුෂ ලක්ෂණ ගණන.

(i) තිස් දෙකකි. (ii) තිස් අටකි. (iii) තිස් හතරකි. (iv) හතලිහකි.

(06) උතුම් සැප ලැබ දෙන යන කවියේ ඊළඟ පදය වන්නේ,

(i) දුර සිට රැගෙන එන (ii) දනක් දීමට නිසි වන
(iii) පිදුමට නිසි බැවින (iv) මහගු පිළිවෙත් සුරකින

(07) මනා පිළිවෙත් ඇති නිසා භික්ෂුව හඳුන්වන්නේ කුමන නමකින්ද?

(i) උජුපටිපන්නෝ යන නමිනි. (ii) සාමීචි පටිපන්නෝ යන නමිනි.
(iii) ඤාය පටිපන්නෝ යන නමිනි. (iv) සුපටි පන්නෝ යන නමිනි.

(08) රාහුල මාතා හෙවත් යශෝධරා දේවිය පිරිනිවන් පාන විට වයස කොපමණද?

(i) වසර 80 කි. (ii) වසර 78 කි.
(iii) වසර 120 කි. (iv) වසර 87 කි.

(09) ඉතිපිසෝ භගවා යන තෙරුවන් නමදින ගාථා පාඨයේ අන්තර්ගත තෙරුවන් ගුණ ගණන

(i) දහ අටකි. (ii) විසි හතරකි.
(iii) විසි දෙකකි. (iv) තිස් දෙකකි.

(10) බුදු රජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතුව නිදන් කොට ඉදිකළ චෛත්‍යය වන්නේ,

(i) මුතියංගන චෛත්‍යය (ii) කතරගම කිරිවෙහෙර
(iii) සේල චෛත්‍යය (iv) අභයගිරි චෛත්‍යය

(11) බුද්ධත්වයෙන් පස්වන වර්ෂයේදී බුදු රජාණන් වහන්සේ වැඩම කළේ කවර ස්ථානයකටද?

(i) නාගදීපයට (ii) මහියංගනයට

(iii) කැලණියට (iv) ශ්‍රී පාදයට

(අනෙක් පිටුව බලන්න.)

(12) විශාලා මහනුවර ලිච්ඡවී රජ දරුවන් මෙහෙනවරක් කරවා පූජා කළේ කාටද?

(i) ඛේමා තෙරණියට (ii) උත්පලවණ්ණා තෙරණියට
(iii) ප්‍රජාපතී ගෝතමියට (iv) පටාචාරා තෙරණියට

(13) සිදුහත් කුමරු ඉපදී මහාමායා දේවිය කලුරිය කළේ දින,

(i) හතරකදීය. (ii) හතක දීය.
(iii) දාහතරක දීය. (iv) විසි එකකදීය.

(14) අභිඥාලාභිනී භික්ෂුණීන් අතරින් අගතැන්පත් වූ රහත් මෙහෙණිය කවුද?

(i) මහා ප්‍රජාපතී ගෝතමිය. (ii) නන්දා භික්ෂුණිය
(iii) සේලා භික්ෂුණිය (iv) යශෝදරා තෙරණිය

(15) ශාක්‍ය - කෝලිය දෙපිරිස අතර ජලය බෙදා ගැනීම සම්බන්ධයෙන් ගැටුමක් ඇති වූයේ කවර ගංගාවක් හේතු කොටගෙනද?

(i) රෝහිණී නදිය (ii) අචිරවතී නදිය
(iii) ගංගා නදිය (iv) නේරංජනා නදිය

(16) චුන්ද කර්මාර පුත්ත විසින් පිරිනමන ලද දානය සමාන කර ඇත්තේ කවරෙකු විසින් පිළිගැන්වූ දානයකටද?

(i) විශාකා මහෝපාසිකාව දුන් දානයටය.
(ii) අසදෘශ මහා දානයටය.
(iii) බිම්බිසාර රජුදුන් දානයටය
(iv) සුජාතාව දුන් දානයටය.

(17) බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ,

(i) මජ්ඣිම යාමයේ දීය. (ii) පශ්චිම යාමයේදීය
(iii) අලුයම කාලයේය. (iv) දිවා කාලයේදීය.

(18) තුන් බෑ ජටිලයන් වාසය කළේ

(i) වේරංජනා නුවරය. (ii) කිඹුල්වත් පුරයේය.
(iii) උරුවෙල් දනව්වේය. (iv) විශාලා මහනුවරය.

(19) වේළුවනාරාමය කරවා පූජා කළේ,

(i) සුද්ධෝදන රජතුමාය. (ii) අජාසත්ත රජතුමාය.
(iii) බිම්බිසාර රජතුමාය. (iv) අනේ පිඬු සිටුතුමාය.

(20) බුදුරජාණන් වහන්සේ සමවත් සුවයෙන් වැඩ සිටි දීඝවාපි චෛත්‍යය පිහිටා ඇත්තේ,

(i) අනුරාධපුර දිස්ත්‍රික්කයේය.
(ii) මොනරාගල දිස්ත්‍රික්කයේය.
(iii) බදුල්ල දිස්ත්‍රික්කයේය.
(iv) අම්පාර දිස්ත්‍රික්කයේය.

(ලකුණු 20 x 2 = 40)

(අනෙක් පිටුව බලන්න.)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

**(01)** කෙටි පිළිතුරු ලියන්න.

I. ථූපාර්හ පුද්ගලයන් දෙදෙනෙක් නම් කරන්න.
II. සැදැහැත් බෞද්ධයෙකු විසින් දැක වැඳපුදා ගතයුතු ස්ථාන දෙකක් ලියන්න.
III. බුදු රජාණන් වහන්සේට නින්දා අපහාස කළ කාන්තාවන් දෙදෙනෙක් නම් කරන්න.
IV. චතුර්වර්ණයට ගැනෙන කුල දෙකක් ලියන්න.
V. සතර අගතියෙන් දෙකක් නම් කරන්න.
VI. දෙවියන් උදෙසා දේශනා කර ඇති සූත්‍ර දෙකක් නම් කරන්න.
VII. "පුදමින් සිව්පසය - උවටැන්වලට සුදුසුය" ඉතිරි පද දෙක ලියන්න.
VIII. ත්‍රිශික්ෂාවෙන් දෙකක් ලියන්න.
IX. කාන්තා පක්ෂය හා පිරිමි පක්ෂය භාවනා කිරීමේ දී තැන්පත් වන ක්‍රමදෙක කුමක්ද?
X. යශෝදරා දේවියගේ දෙමව්පියන් නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20)

**(02)**

I. බුද්ධ චරිතයේ විශිෂ්ට ලක්ෂණ පහක් නම් කරන්න.
II. හන්දදානි භික්ඛවේ ........................ යන ගාථාව සම්පූර්ණ කරන්න.
III. එහි අර්ථය ලියන්න.
IV. සංඝරත්නයේ ගුණ පහක් තෙරුවන් වදින ගාථාවෙන් උපුටා දක්වන්න.

(ලකුණු 20)

**(03)**

I. අෂ්ට ගරු ධර්මවලින් පහක් ලියන්න.
II. භික්ෂුණී සාසනයට ඇතුළු වූ කාන්තාවන් පස්දෙනෙක් නම් කරන්න.
III. අටමස්ථානවලින් පහක් ලියන්න.
IV. සිරිමත් බඹසිරසෙහි පා පිසිනා කවිය සම්පූර්ණ කරන්න.

(ලකුණු 20)

**(04)**

I. භාවනා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.
II. වන්දනා ගමනක් යන සැදැහැතියෙකු පිළිපැදිය යුතු කරුණු පහක් ලියන්න.
III. මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. මහාප්‍රජාපතී ගෝතමිය.
2. යශෝදරා දේවිය
3. අටමස්ථානය
4. ධම්ම පදය

(ලකුණු 20)